ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2023-01-09

පැමිණිලි පාර්ශවය : 1. පී.එල්. රම්‍යලතා මිය.
වදේවත්ත,
හොරවල, වැලිපැන්න.

2. ඩබ්ලිව්.ජී.ඩී.පී.කුමාර මහතා,
අංක : 67, රණවිජයගම,
වැලිපැන්න.

වගඋත්තරකාර පාර්ශවය : 1. පො.ප. කරුණාරත්න මයා,
පොලිස් ස්ථානය,
වැලිපැන්න.

2. පො.සැ. 24449 ජයතිස්ස මයා,
පොලිස් ස්ථානය,
වැලිපැන්න.

3. පො.කො. 60295 චමින්ද කුමාර ජයරත්න මයා,
පොලිස් ස්ථානය,
වැලිපැන්න.

<u>පැමිණිලි අංකය : **HRC/2257/15, HRC/2606/15**</u>

පැමිණිල්ල :-

HRC/2257/15 දරණ පැමිණිල්ලේ පැමිණිලිකාරිය සිය කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ, ඩබ්ලිව්.ජී. මනුෂ පුෂ්පකුමාර, ඩබ්ලිව්.ජී. ධම්මික පුෂ්පකුමාර සහ ඩබ්ලිව්.ජී. ධනුෂ්ක සම්පත් යන තම සහෝදරයන් තිදෙනා 2015.06.27 වන දින රැකියාව සඳහා ගොස් එනවිට මඩවල ගමෙහි ප්‍රසන්න නැමැත්තාගෙන් දුරකථන ඇමතුමක් ලැබී ඇති බවත්, ඔහු දුරකථන ඇමතුමෙන් මඩවල ගමට පැමිණෙන ලෙසට සහෝදරයන්ට දන්වා ඇති බවත් සඳහන් කර ඇත. සහෝදරයන් තිදෙනා එම ස්ථානයට යනවිට ප්‍රසන්න නැමති අය පොලිසිය එම ස්ථානයට ගෙන්වාගෙන තිබී ඇති අතර, මොවුන් එම ස්ථානයට ගියවිට කිසිදු විමසීමකින් තොරව පොලිස් නිලධාරීන් හෙල්මට් එක දමා සිටියදී ඔළුවට පොලු පහරක් ගසා ඇති බවත්, බයිසිකලයට ද පහරදී ඇති බවත්, ධනුෂ්ක සහ ධම්මික බිම වැටුනු පසුව යකඩ පොලු වලින් පහරදී ඇති බවත් දක්වා ඇත. එම පහරදීම හේතුවෙන් මනුෂ යන අයගේ අත ඉදිමී ඇති බවත් ධම්මික යන අයගේ අත් දෙක සහ කකුල් දෙක තුවාල වී තිබූ බවත්, පසුව පොලිස් ජීප් රථයේ දමාගෙන නිවසට පැමිණ ගෙදර සියළු දෙනා ඉදිරිපිටදී ධනුෂ්කට පොල්ලකින් පහරදුන් බවත්, පසුව එම ජීප් රථයේම නංවාගෙන පොලිසියට රැගෙන ගිය බවත් සඳහන් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

තවද, අගතියට පත් වීරසිංහ ආරච්චිගේ ධම්මික පුෂ්පකුමාර යන අය පැමිණිලි අංක HRC/2606/15 යටතේ පැමිණිල්ලක් කරමින් සඳහන් කර ඇත්තේ, 2015.06.27 වන දින රාත්‍රියේ තමාත්, ඔහුගේ සහෝදරයින් දෙදෙනාත් යතුරු පැදි දෙකකින් මඩවල පාසල අසලට ගමන් කරමින් සිටියදී වැඩ බලන ස්ථානාධිපති ඇතුළු නිලධාරීන් හය දෙනෙකු විසින් ඔවුන්ට අතින් පයින් පහරදුන් බවත්, පොලු මුගුරු වලින් ද පහරදුන් බවත්, යතුරු පැදි වලට ද හානි කළ බවත්ය. පසුව අධිකරණයට ඉදිරිපත් කරන ලද බවත්, අධිකරණයට ඉදිරිපත් කරන ලද්දේ දෙපරිසක් අතර ඇතිවූ ගැටුමකදී අත්අඩංගුවට ගත් බවට බොරු චෝදනා එල්ල කරමින් බවත් සඳහන් කර ඇත. තවද, අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙර ඉත්තැපාන රජයේ රෝහලේ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළ බවත්, සත්‍ය සිද්ධිය වෛද්‍යවරයාට ප්‍රකාශ නොකරන ලෙසට තර්ජනය කළ බවත්, එම නිසා පහරදුන් බවට වෛද්‍යවරයාට ප්‍රකාශ නොකල බවත් ප්‍රකාශ කර ඇත. නමුත් මහේස්ත්‍රාත්වරයා විසින් ඇප මත නිදහස් කිරීමෙන් පසුව නාගොඩ මහ රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබාගත් බවත්, අධිකරණ වෛද්‍ය පරීක්ෂණයකට ද යොමු වූ බවත් සඳහන් කර ඇත.

අගතියට පත් ඩබ්ලිව්.ජ්.ධනුෂ්ක සම්පත් යන අය දිවුරුම් ප්‍රකාශයක් මගින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2015.06.27 වන දින සවස 6.30 ට පමණ තමා සේවය නිම කර තම නැන්දාගේ පුතා වන මනූෂ සමග නිවස වෙත පැමිණෙමින් සිටි බවත්, මගදී රාත්‍රී ආහාර ලබාගත් බවත්, එසේ ආහාර ගනිමින් සිටියදී මනූෂ මල්ලී වෙත ප්‍රසන්න නැමැති අය දුරකථන පණිවිඩයක ලබාදී ප්‍රශ්ණයක් කතා කිරීම සඳහා මඩවල පාසල අසලට පැමිණෙන ලෙසට දැනුම්දුන් බවත්, පසුව ඔවුන් හමුවීමට තමාගේ සොහොයුරා වන ධම්මික සමග තමාගේ යතුරු පැදියෙන් ද මනූෂ ඔහුගේ යතුරු පැදියෙන් ද එම ස්ථානයට ගිය බවත්, මඩවල පාසල අසලදී 7 දෙනෙක් පමණ පිරිසක් පාර අයිනේ සැගව සිට එක්වරම එක් අයෙකු තමාගේ යතුරු පැදිය පිටුපස ගමන් කළ තම සොහොයුරා වන ධම්මිකට පොල්ලකින් පහරදුන් බවත්, ඔහු එම ස්ථානයේම බිම වැටුනු බවත්, යතුරු පැදිය නොනවත්වා ගමන් කරන අතරතුරදී කිහිපදෙනෙකු ලුහුබැඳ ඒ දෙසට වෙඩිල්ලක් ද තැබූ බවත්, පසුව තමාගේ ලොකු අම්මාගේ පුතා වන අසංකට මෙම සිදුවීම පවසා පොලිස් හදිසි ඇමතුම් 119ට ඇමතුමක් ලබාදුන් බවත්, ඒ වනවිට පොලිස් ජීප් රථය විදුහල ඉදිරිපිට නවතා තිබූ බවත්, පසුව පොලිසියේ ලොකු මහත්තයාට අපි තමයි 119 ට කථා කලේ යැයි ප්‍රකාශ කළ බවත්, පසුව ලොකු මහතා පොලිස් ජීප් රථයෙන් බැස්ස පසු ඒ අසල සිවිල් ඇඳුමින් සැරසී සිටි පොලිස් නිලධාරියෙකු තමා දෙස බලා "තෝ නේද බයික් එකෙන් පලා ගිය එකා" කියා ඇසූ බවත්, පසුව ලොකු මහතා ඔහුගේ පිස්තෝලය තමාගේ හිස මතට තබා තර්ජණය කළ බවත්, පසුව එතන සිටි නිලධාරීන් තමාට අතින් පයින් සහ පොලු වලින් අමානුෂික අන්දමින් පහරදුන් බවත්, එවිට තමාගේ නැන්දා ද එම ස්ථානයට පැමිණි බවත්, ඇය පහර නොදෙන ලෙසට කෑගැසූ බවත් සඳහන් කර ඇත. පසුව අසංක නැමැති අය සමග තමාව ජීප් රථයේ නංවාගෙන නිවස වෙත රැගෙන ගොස් තමාගේ යතුරු පැදිය නිලධාරියෙක් විසින් රැගෙන ආ බවත්, පසුව වැලිපැන්න පොලිසිය වෙත රැගෙන ගිය බවත් සඳහන් කර ඇත. පසුදින 12.00 ට පමණ ඉත්තැපාන රෝහල වෙත රැගෙන ගිය බවත්, පහරදුන් බවට නොකියන ලෙසට ප්‍රකාශ කළ බවත්, එසේ ප්‍රකාශ කළහොත් බෝම්බයක් දමා හෝ ගිනි අවි පනත යටතේ හෝ නඩු දමන බවට තර්ජණය කළ බවත් සඳහන් කර ඇත.

වෛද්‍යවරයා විසින් තමාට නේවාසිකව ප්‍රතිකාර කළ යුතු බව පැවසූ නමුත් පොලිසිය විසින් එයට විරුද්ධ වී පුද්ගලික තැනකින් බෙහෙත් දමා නැවත පොලිසියට රැගෙන ආ බවත්, පසුව මතුගම අධිකරණයට ඉදිරිපත් කළ බවත්, අධිකරණයේදී පොලිසිය විසින් පහරදුන් බවට ප්‍රකාශ කළ බවත්, පසුව අධිකරණය විසින් ශරීර ඇප මත නිදහස් කළ පසු නාගොඩ රෝහල වෙත ඇතුළත් වී ප්‍රතිකාර ලබාගත් බවත් සඳහන් කර ඇත.

අගතියට පත් ඩබ්ලිව්.ජ්.මනූෂ පුෂ්පකුමාර යන අය දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් ප්‍රකාශ කර ඇත්තේ, 2015.06.27 වන දින පස්වරු 6.30 ට පමණ තමා සේවය නිම කර තමාගේ නැන්දාගේ පුතා වන ධනුෂ්ක සම්පත් යන අයගේ නිවසට ගිය බවත්, පසුව ප්‍රසන්න නැමැති අය තමාට

දුරකථනයෙන් ඇමතුමක් ලබාදී ප්‍රශ්නයක් කතා කර ගැනීම සඳහා මඩවල පාසල අසලට පැමිණෙන ලෙසට දැන්වූ අතර, පසුව විනාඩි 15 කින් පමණ ඔහු හමුවීම සඳහා තමා තමාගේ යතුරු පැදියෙන් ද, ධනුෂ්ක යන අය සහ ඔහුගේ සොහොයුරා වන ධම්මික ද සමග ඔහුගේ යතුරු පැදියෙන්ද ගිය බවත්, මඩවල පාසල අසලදී 7 දෙනෙක් පමණ පිරිසක් පාර අයිනේ සැඟව සිට එක්වරම ධනුෂ්ක යන අයගේ යතුරු පැදියටත් තමාගේ යතුරු පැදියටත් පොල්ලකින් පහරදී අලාභහානි කළ අතර, තමාට සහ ධම්මික අයියාට පොලු වලින් අමානුෂික අන්දමින් පහරදුන් බවත්, පසුව ඔවුන් දෙදෙනාට මාංචු දමා පාළු පාරක් අයිනේ නතර කර තිබූ වැලිපැන්න පොලිසියේ ජීප් රථය අසලට රැගෙන ගොස් ජීප් රථය ඇතුළට තල්ලු කළ බවත් එම නිලධාරීන් අධික ලෙස මත්පැන් පානය කර සිටි බවත් සඳහන් කර ඇත. පසුව තමාගේ නිවසට ගොස් අසංක සහ මධුශංක යන අයව ද ජීප් රථයේ නංවාගෙන වැලිපැන්න පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්, තමාව සහ ධම්මික යන අයව මාංචු දමා කූඩුවට දැමූ බවත්, ධනුෂ්ක යන අයව ද කූඩුවට දැමූ බවත් සඳහන් කර ඇත. පසුව ඉත්තැපාන රෝහලට රැගෙන ගිය බවත්, පහරදුන් බව නොකියන ලෙසට තර්ජය කළ බවත් සඳහන් කර ඇත. අනතුරුව අධිකරණයට ඉදිරිපත් කර ඇප මත මුදාහැරීමෙන් පසුව කළුතර රෝහලට ගොස් ප්‍රතිකාර ලබාගත් බවත් සඳහන් කර ඇත.

පැමිණිල්ලට සාක්ෂි වශයෙන් වැලිපැන්න, හොරවල, වදේවත්ත දරණ ලිපිනයෙහි පදිංචි කේ.කේ .ධම්මිකා ප්‍රියන්ති යන අය තම දිවුරුම් ප්‍රකාශය මගින් දක්වා ඇත්තේ, 2015.06.27 වන දින රාත්‍රි 9.00 ට පමණ තමා නිදහසේ සිටිනවිට වාහනයක් පැමිණි බවත්, පරුෂ වචනයෙන් බැණ වැදී දොර විවෘත කරන ලෙසට දැන්වූ අතර, තම සහෝදරියගේ පුතුන් දෙදෙනා වන ධනුෂ්ක සහ අසංක යන අය තම නිවස දෙසට පැමිණෙනු දුටු බවත්, ඒ සමග අසංක පුතා "අපි තමයි 119 ට පැමිණිලි කලේ" යනුවෙන් ලොකු මහත්තයාට ප්‍රකාශ කළ බවත්ය. ඉන්පසුව එම ස්ථානයේ සිවිල් ඇඳුමින් සිටි නිලධාරීන් ධනුෂ්ක පුතාට අතින් පයින් සහ පොලු වලින් අමානුෂික අන්දමින් පහරදෙනු තමා දුටු බවට සඳහන් කර ඇත.

අගතියට පත් පාර්ශවයන්ගේ අධිකරණ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව වෙත කැඳවා ඇති අතර, ඒ අනුව කේ.එම්. මනුෂ පුෂ්පකුමාර යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව බරපතල නොවන තුවාල 09 ක් ඇති බවට සඳහන් වේ. එම වෛද්‍ය වාර්තාවේ අධිකරණ වෛද්‍යවරයාගේ මතය වී ඇත්තේ අදාල තුවාල රෝගියා විසින් ඉදිරිපත් කර ඇති කෙටි ඉතිහාසය හා සැසඳෙන බවයි.

අගතියට පත් ධම්මික පුෂ්පකුමාර යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව බරපතල නොවන තුවාල 24 ක් ඇති බවට සඳහන් වේ. වෛද්‍යවරයාගේ මතය වී ඇත්තේ, මෙම තුවාල වල ස්වභාවය අනුව බොහෝ දුරට එය සිදුව ඇත්තේ පහරදීමකින් බවයි. ඒ අනුව තුවාල වල ස්වභාවය හා රෝගියා විසින් ඉදිරිපත් කර ඇති රෝගී ඉතිහාසය හා ගැලපෙන බවද දක්වා ඇත.

ඩබ්ලිව්.ජී .ධනුෂ්ක සම්පත් යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව, බරපතල නොවන තුවාල දෙකක් ඇති බව සඳහන් කර ඇත. වෛද්‍යවරයාගේ මතය වී ඇත්තේ, අදාළ තුවාල වල ස්වභාවය හා රෝගියා විසින් ඉදිරිපත් කර ඇති ඉතිහාසය ගැලපෙන බවයි.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

ස්ථානාධිපති, වැලිපැන්න විසින් අදාල පැමිණිල්ල සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත වාර්තාවක් සපයා ඇත. 2015.08.19 දිනැති එම වාර්තාව මගින් සඳහන් කර ඇත්තේ, 2015.06.27 වන දින රාත්‍රියේ මඩවල වැලිපැන්න ප්‍රදේශයේ පදිංචි තිලූපුල් නැමැත්තාට සහ ප්‍රසන්න නැමැත්තාට පුද්ගලයෙකු දුරකථන ඇමතුමක් ලබාදී එම පුද්ගලයන් දෙදෙනාට

පහරදීමට පැමිණෙන බව පවසමින් තර්ජණය කරන ලද බවත් ඒ හේතුවෙන් බියට පත්ව සැඟවී සිටින බවත් පවසමින් පොලිස් ස්ථානය වෙත පණිවුඩයක් ලැබී තිබූ බවයි. ඒ අනුව වැලිපැන්න පොලිසියේ පො.ප. කරුණාරත්න නිලධාරියා ඇතුළු නිලධාරින් කණ්ඩායමක් පරික්ෂන පැවැත්වීම සඳහා අදාල ප්‍රදේශයට ළගා වන අවස්ථාවේදී යතුරු පැදි දෙකකින් පැමිණි පුද්ගලයන් හතර දෙනෙක් පුද්ගලයින් දෙදෙනෙක්ට පහරදෙමින් සිට ඇති බවත්, එම තත්ත්වය පාලනය කිරීමට පොලිස් නිලධාරින් එම ස්ථානයට යනවිට පහරදෙමින් සිටි පුද්ගලයන් යතුරු පැදියේ නැගී පලා යාමට උත්සහ කරන අවස්ථාවේදී යතුරු පැදි දෙකක් සහ පුද්ගලයන් තිදෙනෙක් අත්අඩංගුවට ගෙන ඇති බවත්, පලා යමින් සිටි යතුරු පැදිය පෙරලී තිබූ අතර, යතුරු පැදියේ සිටි එක් පුද්ගලයෙකුට තුවාල වී තිබූ බවත් සඳහන් කර ඇත. වැඩිදුර පරික්ෂණ පැවැත්වීමේදී අදාල පුද්ගලයන් දෙදෙනාට පහරදීමට පැමිණි පුද්ගලයන් බවට හඳුනාගත් අතර, ඔවුන් ඩබ්ලිව්.ජ්. ධනුෂ්ක පුෂ්පකුමාර, ඩබ්ලිව්.ජ්. ධම්මික පුෂ්පකුමාර, ඩබ්ලිව්.ජ්. මනුෂ සම්පත් යන අය බවට හඳුනා ගත් බවත්, පසුව පලාගොස් ඇති පුද්ගලයා කොස්වත්තගොඩ මානගේ විජය නන්ද නැමැත්තෙක් බවට විමර්ශන නිලධාරින් විසින් හඳුනාගෙන ඇති අතර, අත්අඩංගුවට පත් පුද්ගලයන් තිදෙනා සතුව තිබූ පොල්ලක් සහ පිහියක්ද අත්අඩංගුවට ගත් බවත්, අත්අඩංගුවට ගත් එකී සැකකරුවන් පොලිස් ස්ථානයට ඉදිරිපත් කර පසුව 2016.06.28 දින අධිකරණයට ඉදිරිපත් කළ බවත් දක්වා ඇත.

1 වන වගඋත්තරකරු ලෙස නම් කර ඇති පො.ප. ඩබ්ලිව්.ජ්.සී.කරුණාරත්න යන අය කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත්තේ, 2015.06.27 වන දින තමා වැඩබලන ස්ථානාධිපති ලෙස සේවය කළ බවත් එදින රාත්‍රී 9.30 ට පමණ 119 දුරකථන අංකය මගින් පණිවිඩයක් ලද අතර, එම අංකය UPR 15406 බවත්, ඒ අනුව 21.35 ට පො.සැ. 24649 ජයතිස්ස, පො.කො. 60295 චමින්ද, පො.කො. 81903 වසන්ත, පො.කො.රි. 36219 අතුල යන අය සමග KO 8929 දරණ ජීප් රථයෙන් අදාල ස්ථානයට ගිය බවත්, එසේ යන අතරතුරදී පුද්ගලයෙකු තමන්ට පහරදීම සඳහා පිරිසක් පැමිණෙන බවත්, ඔවුන් කැලයට පැමිණ සිටින බවටත් දැන්වූ බවත්, එම ස්ථානයට යනවිට 4 දෙනෙක් සිටි අතර, මීටර් 100 ක් පමණ දුරින් ජීප් රථය නවතා පයින් ගිය බවත්, එම පිරිස දෙදෙනෙකුට පහරදෙමින් සිටි බවත්, තමා විසින් අහසට තම රිවෝල්වරයෙන් වෙඩි දෙකක් තැබූ බවත්, එම අවස්ථාවේදී ඔවුන් පලායාමට උත්සාහ කිරීමේදී එම ස්ථානයේම එක් යතුරු පැදියක් සහ සැකකරුවන් දෙදෙනෙක් අත්අඩංගුවට ගත් බවත්, අනෙක් යතුරු පැදිය පලාගොස් මඩවල ප්‍රදේශයේ දි යතුරු පැදිය පාලනය කිරීමට නොහැකිව වැටී සිටි බවත්, එක් අයෙක් අත්අඩංගුවට ගත් බවත්, ඔහු වීරසිංහ ආරච්ගේ ධනුෂ්ක බවත්, පසුව යතුරු පැදි දෙක හා සැකකරුවන් තිදෙනා මෙම සිද්ධිය වූ ස්ථානයේ සිටි තවත් පුද්ගලයෙක් ද අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරීමෙන් පසුව යතුරු පැදියෙන් පලාගිය දෙදෙනා ද අත්අඩංගුවට ගත් බවත්, එම සිදුවීම වූ ස්ථානයේ සිටි තවත් අයෙක් අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමෙන් පසුව ඔහු නිදහස් කළ බවත්, අනෙක් තිදෙනා පොලිස් ස්ථානයට ඉදිරිපත් කර අධිකරණ වෛද්‍ය පෝමර 290, 291 සහ 292 යටතේ ඉත්තැපාන රජයේ රෝහල වෙත ඉදිරිපත් කර පසුව බී වාර්තාවක් මගින් අධිකරණයට ඉදිරිපත් කළ බවත්, සැකකරුවන්ගේ ශරීරයේ තුවාල තිබීම සම්බන්ධයෙන් උපසේවා නිලධාරියාද සටහන් යොදා ඇති බවත් සඳහන් කර ඇත.

මනුෂ පුෂ්පකුමාර යන අයගේ වම් අතේ මැණික් කටුව හා වම් අතේ වැලමිට, උරහිස තුවාල වී තිබූ බවත්, ධම්මික යන අයගේ කකුල් දෙක, අත්දෙක හා වැලමිට දෙක තුවාල වී තිබූ බවත්, ධනුෂ්ක සම්පත් යන අයගේ උරහිසේ තැලීම් තුවාලයක් ද තිබූ බවත්, යතුරු පැදියේ පෙට්‍රල් ටැංකිය තැලී ප්‍රධාන ලාම්පු බිඳී තිබූ බවත්, අනෙක් යතරු පැදිය ලියාපදිංචි නොකළ යතුර පැදියක් බවත්, එයද සිරි තිබූ බවත් සඳහන් කර ඇත.

ඒට අමතරව ධනුෂ්ක යන අය රැගෙන ආ අගල් 2x2, අඩි 1, 1/2 ක් දිග පොල්ලක් ද, ධම්මික යන අය රැගෙන ආ අඩි 2, 1/2 ක් දිග පොල්ලක් ද නඩු භාණ්ඩ වශයෙන් කුච්තාන්සි අංක :

119/15 ට ඇතුළත් කර තත්වය පාලනය කිරීමට වෙඩි තැබූ හිස් කොපු දෙක ද නඩු භාණ්ඩ කුවිතාන්සි අංක 120/15 වශයෙන් ඇතුළත් කර උපසේවයට භාරදුන් බවත්, පසුව අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත්, ආරවුල ඇතිවූ අනෙක් පාර්ශවයේ සංජීව සහ ප්‍රසන්න මදුරංග යන අයගේ සාක්ෂි සටහන් කළ බවත් සඳහන් කර ඇත. තවද, පහරදීමක් සිදුකරන ලද බවට කරන චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්, අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ද මොවුන්ගේ ශරීරය තුවාල වී තිබූ බවත් සඳහන් කර ඇත.

2 වන වගඋත්තරකරු ලෙස නම් කර ඇති පො.සැ. 24449 ජයතිස්ස කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, 2015.06.27 දින වැලිපැන්න පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කළ බවත්, රාත්‍රි 9.00 ට පමණ වැලිපැන්න, මඩවල ප්‍රදේශයේ පරණ පාසල අසල දෙපිරිසක් අතර පහරදීමක් සිදුවන බවත්, එම ස්ථානයට යන ලෙසත් වැඩ බලන ස්ථානාධිපති ලෙස කටයුතු කළ පො.ප. කරුණාරත්න මහතා දන්වා සිටි බවත්, ඒ අනුව පො.ප. කරුණාතිලක මහතාත් පො.කො. 60295 චමින්ද, පො.කො. 81903 සංඛ නිලධාරියාත් සමග පො.කො.රි. අතුල නිලධාරියා විසින් පදවන ලද රථයෙන් අදාළ ස්ථානයට ගිය බවත්ය. මීටර් 10 ක් පමණ මෙහායින් ජීප් රථය නතර කර පො.කො.රියදුරු ජීප් රථයේ රඳවා අනෙක් පිරිස ඉදිරියට ගිය බවත්, එසේ යනවිට මඩවල පාසල අසල දෙපිරිසක් ගහගන්නවා දුටු බවත්, පුද්ගලයින් 6 හෝ 8 දෙනෙක් එහි සිටි බවත්, පො.ප. කරුණාරත්න මහතා "කව්ද ඔය කට්ටිය" කියා අහගෙන ඉදිරියට ගිය බවත්, එවිට පිරිස පරුෂ වචන කියමින් ගහන්න පැමිණි බවත්, එවිට කරුණාරත්න මහතා අහසට වෙඩි තැබූ බවත්, පසුව එම පිරිස බයිසිකල් වල නැගී එහෙට මෙහෙට යාමට උත්සහ කළවිට වට කර තිදෙනෙක් අල්ලා ගත් බවත්, සයිකල් 2 ක් ඉදිරියට ගිය බවත්, එක් යතුරු පැදියක් එතනම පෙරළුනු බවත්, තවත් දෙදෙනෙක් ඉදිරියට ගිය බවත්, කට්ටියක් ජීප් රථයේ දාගෙන ඉදිරියට යනවිට මෙම සිද්ධියට සම්බන්ධ වූ අයෙකු බයිසිකලය පෙරළී සිටි බවත්, පසුව එම කට්ටියව ද ජීප් රථයේ දමාගෙන පොලිස් ස්ථානයට පැමිණි බවත් සඳහන් කර ඇත. එසේම තමා සමග ගිය කිසිදු නිලධාරියෙක් කිසිදු පුද්ගලයෙකුට පහරදීමක් නොකළ බවත්, අත්අඩංගුවට ගත් පුද්ගලයන් දෙදෙනාගෙන් තමා ප්‍රකාශ සටහන් කළ බවත් යතුරු පැදි දෙකක් ද ස්ථානයට ඉදිරිපත් කළ බවත්, එම යතුරු පැදි වල කොටස් කැඩී තිබූ බවට සඳහන් කර ඇති අතර, පොලිස් ස්ථානයේදී හෝ කිසිදු අයෙකුට පහරදීමක් නොකළ බවත් සඳහන් කර ඇත.

අදාළ අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරි විසින් අසන ලද ප්‍රශ්න වලට පිළිතුර ලෙස වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ පාසල අසලදී තිදෙනෙක් අත්අඩංගුවට ගත් බවයි. තවත් අයෙකු සැක පිට අත්අඩංගුවට ගැනීමට හේතුව ඔහු ලග ලියාපදිංචි නොකළ යතුරු පැදියක් ලග තබා ගැනීම බවත් පසුව ඔහුව ඇප මත නිදහස් කළ බවත්ය. මොවුන්ගේ ශරීර වල තැලීම් තුවාල තිබූ බවත්, ඒවා ගැටුමේදී සිදුවූ ඒවා බවත්, පසුව ඉත්තැපාන රජයේ රෝහල වෙත ඉදිරිපත් කර පසුව අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු රු. 50,000/- ක් බැගින් වූ ශරීර ඇප මත මුදාහැරි බවද සඳහන් කර ඇත. අත්අඩංගුවට ගත් අය ලග තිබී පිහි සහ පොලු ද අත්අඩංගුවට ගත් බවද සඳහන් කර ඇත.

3 වන වගඋත්තරකරු වන පො.කො. 60295 චමින්ද කුමාර ජයරත්න යන අය කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, අදාළ සිද්ධිය වූ දින තමා වැලිපැන්න පොලිස් ස්ථානයේ රාජකාරි කළ බවත්, දිවා කාලයේ රාජකාරි කිරීමෙන් පසුව විවේකිව සිටින අතරතුර මඩවල පරණ පාසල අසල දෙපිරිසක් ගහගන්නා බවට තොරතුරු ලැබී තිබූ බවත් වැඩ බලන ස්ථානාධිපතිවරයාගේ දැනුම්දීමක් අනුව ඔහු සමග එම ස්ථානය පරීක්ෂා කිරීමට ගිය බවත්ය. තවද, අදාළ නිලධාරින් සමග එම ස්ථානයට ගොස් මීටර් 100 ක් පමණ මෙහායින් ජීප් රථය නවතා ඉදිරියට යනවිට යතුරු පැදියක් රේස් කරන ශබ්දයක් සහ කට්ටියක් කෑගහන ශබ්දයක් ඇසුනු බවත්, පසුව එදෙසට ගොස් පො.ප.කරුණාරත්න මහතා "ඔතන මොකද වෙන්නේ" කියා කෑගැසූ බවත්, එවිට "උඹලා කව්ද" කියා කට්ටියක් තමන් ඇතුළු කණ්ඩායම සිටි දෙසට ආ බවත්, ඔවුන් අත පොලු තිබූ බවත්, එක් අයෙක් ගාව පිහියක් තිබූ බවත්, එවිට

ගුණාරත්න මහතා අහසට වෙඩි උණ්ඩ දෙකක් තැබූ බවත් සඳහන් කර ඇත. පිරිස යතුරු පැදි දෙකක හෝ තුනක නැග පලා ගිය බවත්, බයික් එකක් හරවා රේස් කර යනවිට වැටුනු බවත්, පසුව ඔවුන්ව ජීප් රථයට දමා ගත් අතර, යතුරු පැදිය කැඩී තිබූ බවත්, ඔවුන්ව පරීක්‍ෂා කිරීමේදී එක් අයෙකුගේ පිටුපස ප්‍රදේශයේ පිහියක් සගවා තිබූ බවත්, තවත් දෙදෙනෙක් ද දුවන අවස්ථාවේදී අල්ලා ගත් බවත්, එම අයත් ජීප් රථයට දමාගත් බවත් සඳහන් කර ඇත.

තවදුරටත් වගඋත්තරකරු සඳහන් කර ඇත්තේ, තවත් යතුරු පැදියක් වේගයෙන් ගමන් කරනවා දුටු බවත්, පසුව එය ලුහුබැන්ද අතර හොරවල දියඋල්පත ප්‍රදේශයෙන් මෙම යතුරු පැදිය අල්ලා ගත් බවත්ය.  එම අය ද ජීප් රථයට නංවා ගත් බවත්, මොවුන්ට කිසිදු පහරදීමක් සිදු නොකළ බවත් ප්‍රකාශ කර ඇත. මෙම අයගේ දණහිස් වල සීරීම් තුවාල තිබූ බවත්, පසුව යතුරු පැදිය සමග ස්ථානයට ඉදිරිපත් කර පසුව රෝහල වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවත් සඳහන් කර ඇත. පසුදින ස්ථනීය පරීක්‍ෂාවක් සඳහා මෙම ස්ථානයට ගොස් සොයා බැලීමේදී බයිසිකලයක් තාප්පයක වැදී කැලී බිම තිබූ අතර අදාළ ස්ථාන පරීක්‍ෂාවේදී ඒ පිළිබඳව සටහන් යෙදූ බවත්, කිසිදු අවස්ථාවක මෙම පුද්ගලයන්ට පහරදීමක් නොකළ බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.

**නිරීක්ෂණ :**

ඩබ්ලිව්.ජ්. ධම්මික පුෂ්පකුමාර, ඩබ්ලිව්.ජ්. ධනුෂ්ක සම්පත් සහ ඩබ්ලිව්.ජ් .මනුෂ පුෂ්පකුමාර යන අයවළුන්ගේ වෛද්‍ය වාර්තා අනුව තුවාල ඇති බවත්, එම තුවාල සම්බන්ධයෙන් වෛද්‍යවරයාගේ මතය අනුව පහරදීමක් සිදුව ඇති බවත් නිරීක්‍ෂණය වේ.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීමේදී සඳහන් කර ඇත්තේ, අදාළ සැකකරුවන් යතුරු පැදි වලින් වැටීම නිසා ඔවුන්ගේ ශරීර වල තුවාල තිබූ බවයි.  එසේම, වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ වල පරස්පරතාවයන් ඇති බවද නිරීක්‍ෂණය වේ.

ඉදිරිපත්වී ඇති වෛද්‍ය වාර්තා අනුව ඩබ්ලිව්.ජ්.ධම්මික පුෂ්පකුමාර යන අයගේ ශරීරයේ බරපතල නොවන තුවාල 24 ක් සඳහන් වන අතර, එම තුවාල ඔහු විසින් වෛද්‍යවරයාට ඉදිරිපත් කර ඇති විස්තරය හා කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශ වල සඳහන් කරුණු හා ගැලපෙන බැවින් වගඋත්තරකරුවන් විසින් එම අයව කෲර හා අමානුෂික සැළකීමට ලක් කර ඇති බවට නිගමනය කළ හැක.

එසේම, ඩබ්ලිව්.ජ්..මනුෂ පුෂ්පකුමාර යන අයගේ වෛද්‍ය වාර්තාව අනුව පහරදීමක් සිදු කර ඇති බව තහවුරු වන බැවින්, වගඋත්තරකරුවන් විසින් මෙම පැමිණිලිකරුව ද කෲර හා අමානුෂික අන්දමට වධහිංසාවට භාජනය කර ඇති බවට නිගමනය කළ හැක.

ධනුෂ්ක සම්පත් යන අයගේ වෛද්‍ය වාර්තාව අනුව ද පහරදීමක් සිදුව ඇති බවට තහවුරු වේ.

**නිගමනය :**

ඒ අනුව වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම මෙම පැමිණිලිකරුවන් තිදෙනා සම්බන්ධයෙන් උල්ලංඝනය  කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය =:

වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් පොලිස්පති විසින් විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතු බවට මෙයින් නිර්දේශ කර සිටිමු.

1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව ඉහත නිර්දේශය බලාත්මක කිරීම පිණිස වගඋත්තර පාර්ශවය විසින් ගන්නා ලද හෝ ගැනීමට අදහස් කරනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධව 2023. 02 - 24 දිනට පෙර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට වාර්තා කරන ලෙසට වගඋත්තර පාර්ශවයට මෙයින් දන්වා සිටිමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

තවද, 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(6) වගන්තිය ප්‍රකාරව මහජන ආරක්ෂක අමාත්‍යවරයා වෙතද අවශ්‍ය පියවර ගැනීම සඳහා මෙම නිර්දේශයේ පිටපතක් යොමු කරනු ලැබේ.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත් =: 01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යංශය,
4 වන මහල, සුහුරුපාය,
බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂ (වගඋත්තරකරුවන්ගේ වර්තමාන සේවා ස්ථාන වෙත නිර්දේශ යොමු කිරීම සඳහා)
පොලිස් මානව හිමිකම් කොට්ඨාශය,
අංක = 07, 7 වන මහල,
එන්.එම් පෙරේරා මාවත,
කොටා ටෙරස්, කොළඹ 08

03. පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01
– ඉහත නිර්දේශය අනුව කටයුතු කිරීමට